## ශීර්ෂය 269 - මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

-----------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 22 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 28 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායීත්වය

පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරුණු ලැබේ.

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|---|
| (අ) | රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුවේ 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන චක්‍රලේඛයේ 07 (iv) සහ (v) වගන්තිය අනුව, මුළු වත්කම්වලට සමානව මුළු වගකීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ හෙළිදරව් කළ යුතු වුවත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වත්කම් වත්කම් රු.2,270,569,959 මුළු එකතුව වශයෙන් වගකීම් රු.110,081,007 ක මුළු එකතුවක් වශයෙනුත් දක්නට විය. | රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛය ප්‍රකාරව වත්කම්වලට සමානව වගකීම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සියළුම වත්කම්වල එතකුවේ වටිනාකමට සමානව සියළුම වගකීම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. |
| (ආ) | රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුවේ 7(ii) වගන්තිය අනුව, වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවට අයත් ආදායම් සියල්ල ආදායම් ප්‍රකාශයේ ආකෘති ඒසීඒ - 01 යටතේ ඇතුළත් නොකළ යුතු බව සඳහන් කර තිබුණත්, චක්‍රලේඛයට පටහැනිය රු.141,555,915 ක් ඇතුළත් කර තිබුණි. | වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවට අයත් ආදායම් සියල්ල ආදායම් ප්‍රකාශයේ ආකෘති ඒසීඒ - 01 යටතේ ඇතුළත් නොකළ යුතුය. | සාමාන්‍යයෙන් අප ආදායම් ශීර්ෂය යටතේ ආදායම් ඇස්තමේන්තු ගිණුමේ ආදායම් ලෙස දක්වා තිබූ අයුරින්ම මෙම වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලද රු.141,555,915 ක් ආදායම් ප්‍රකාශයේ ඇතුළත් කළෙමු. |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | භාණ්ඩාගාර මුද්‍රිත ප්‍රකාරව, 2018 දෙසැම්බර් 31 දිනට ජංගම නොවන වත්කම්වල එකතුව රු.1,748,314,898 ක් ලෙස දක්වා තිබුණත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාල මූල්‍ය ප්‍රකාශනවල එම වටිනාකම රු.2,145,771 ක් ලෙස දැක්වීම නිසා ජංගම නොවන වත්කම් රු.396,858,873 කින් වැඩියෙන් දක්වා තිබුණි. | භාණ්ඩාගාර මුද්‍රිතයේ සඳහන් වූ වත්කම්වල වටිනාකමට සමාන දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වත්කම්වල වටිනාකමට අනුකූල විය යුතුය. | මෙම වෙනස්කම් පිළිබඳව මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවට ලිඛිතව අංක ACC/ASTRR/CU-04/2019-01 දරන 2019 පෙබරවාරි 05 දිනැති ලිපිය මගින්ද රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අංක SA/AS/DD/General දරන 2019 මාර්තු 21 දිනැති ලිපිය මගිනුත් අංක ACC/AST/RR/CU-04/2019-01 දරන 2019 මාර්තු 25 දිනැති ලිපිය මගිනුත් දක්වා ඇති. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ මුදලින් සිදුකළ තැන්පතු ගෙවීම් රු.532,518,047 ක් සහ අත්තිකාරම් ගෙවීම් රු.43,940,552 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වූ මුදල් යෙදවීම් (Out Flow) ලෙස දක්වා නොතිබුණි. | මුදලක් සිදුකළ ගෙවීම් නිවැරදිව හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කළ යුතුය. | තැන්පතු සහ අත්තිකාරම් වශයෙන් ඒසීඒ-එෆ් ආකෘතියේ සඳහන්ව තිබූ නිසා, මෙම වර්ෂය සඳහා තැන්පතු හා අත්තිකාරම් ගෙවීම් එහි සඳහන් කළෙමු. එසේ වුවත්, එම වටිනාකම වැරදීමකින් මෙහෙයුම් ක්‍රියාකාරකම්වල මුදල් මුදල් යෙදවීම් (Out Flow) ලෙස දක්වා නොතිබුණි. |

### 1.6.3 අයකළ යුතු හිඟ ණය අයනොකිරීම

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට අයවීම් හිඟහිට පැවති ශේෂවල එකතුව රු.212,630 ක් වුවත්, එම හිඟ ශේස වර්ෂ 02 සිට වර්ෂ 03 ක් දක්වා කාලයක් ඉක්ම ගොස් තිබුණත් එම හිඟ ණය ශේෂ අයකිරීමේ කටයුතු දුර්වල මට්ටමක | ණය ආපසු නොගෙවන නිලධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කල යුතුය. | මරණ පාරිතෝෂිකයෙන් අයකර ගැනීමට කටයුතු කර තිබුණි. මරණ පාරිතෝෂිකය ලැබූ වහාම නිරවුල් කරනු ලැබේ.<br>2017 ජුනි 23 දින නිලධාරියාගේ හිඟ ණය අයකිරීම් පිළිබඳව නිලධාරියාට එරෙහිව නඩු පැවරීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත. |

පැවැතුණි.

## 2. මූල්‍ය කළමනාකරණය

## 2.1 අතුරු අග්‍රිම කළමනාකරණය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| සැලසුම් කළ ආකාරයෙන් අදාල කාල පරාසය තුළ නියමිත කාර්යයන් ඉටු නොකර, එම කාර්යයන් වර්ෂය අවසානයේ සිදුකිරීමට පෙළඹීමෙන් අවශ්‍ය අතුරු අග්‍රිම භාණ්ඩාගාරයෙන් ලබා නොදුන් බව සඳහන් කර වර්ෂය අවසානයේ එම කාර්යයන් ඉටු නොකළ විවිධ අවස්ථාවන් පැවැතුණි. මෙයට අනුව, සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.424,676,441 ක් වටිනා කාර්යයන් 233 ක් නිමකළ නොහැකි වී තිබුණි. | සැලසුම් කළ ආකාරයෙන් අතුරු අග්‍රිම ලබා නියමිත කාලසීමාව තුල නිම කිරීමට කටයුතු කළ යුතුය. | රේඛීය අමාත්‍යාංශ ප්‍රතිපාදන වර්ෂ අවසානයේ ලබාදීමේදී කාලගුණයේ අහිතකර තත්ත්වයන් ඇති වීම නිසා කාර්යයන් නියමිත කාලය තුළ නිමකළ නොහැකි තත්ත්වයක් ඇති වී තිබූ අතර අග්‍රිම ලබාගැනීමේ අපහසුතාද ඇතිවේ. |

## 2.2 ආදායම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| සැලසුම් කළ ආකාරයෙන් අදාල කාල පරාසය තුළ නියමිත කාර්යයන් ඉටු නොකර, එම කාර්යයන් වර්ෂය අවසානයේ සිදුකිරීමට පෙළඹීමෙන් අවශ්‍ය අතුරු අග්‍රිම භාණ්ඩාගාරයෙන් ලබා නොදුන් බව සඳහන් කර වර්ෂය අවසානයේ එම කාර්යයන් ඉටු නොකළ විවිධ අවස්ථාවන් පැවැතුණි. මෙයට අනුව, සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.424,676,441 ක් වටිනා කාර්යයන් 233 ක් නිමකළ නොහැකි වී | සැලසුම් කළ ආකාරයෙන් අතුරු අග්‍රිම ලබා නියමිත කාලසීමාව තුල නිම කිරීමට කටයුතු කළ යුතුය. | රේඛීය අමාත්‍යාංශ ප්‍රතිපාදන වර්ෂ අවසානයේ ලබාදීමේදී කාලගුණයේ අහිතකර තත්ත්වයන් ඇති වීම නිසා කාර්යයන් නියමිත කාලය තුළ නිමකළ නොහැකි තත්ත්වයක් ඇති වී තිබූ අතර අග්‍රිම ලබාගැනීමේ අපහසුතාද ඇතිවේ. |

තිබුණි.

## 2.3 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| පුනරාවර්තන වැය විෂයයන් 03 ක් සඳහා සලසා තිබූ එකතුව රු.6,525,000 ක ශුද්ධ ප්‍රතිපාදන වලින් රු.2,484,850 ක් මුදල් රෙගුලාසි 66 යටතේ වෙනත් වැය වියන් සඳහා මාරුකර තිබුණි. මෙය සලසා තිබූ ප්‍රතිපාදිතයෙන් සියයට 36 සිට සියයට 50 දක්වා පරාසයක වී තිබුණි. | මුදල් රෙගුලාසි 50 අනුව ඇස්තමේන්තු හැකි අයුරින් සම්පූර්ණව හා නිවැරදිව පිළියෙල කිරීමට ගණන්දීමේ නිලධාරියා කටයුතු කළ යුතුය. | විය හැකි වියදම් ආශ්‍රෙයන් පිළියෙළ කළ ඇස්තමේන්තුව සරල වර්ෂයේ ක්‍රියාත්මක කිරීමේදී අපේක්ෂා නොකළ අයුරින් ඇතිවෙන මිල ගණන් වෙනස්වීම්, කාලගුණික වෙනස්වීම්, වැනි කරුණු නිසා ඉතිරිවීම් සහ අමතර වියදම් සිදුවේ. මේ නිසා ප්‍රතිපාදන මාරු කිරීමට සිදුවිය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අපේක්ෂා කළ ප්‍රතිඵල ලබානොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| මඩකලපුව දිස්ත්‍රික්කයේ පිහිනුම් ශූරශූරියන්ට පිහිනුම් පුහුණුවීම් ලබාදීම මගින් ඔවුන්ගේ හැකියාවන් හෙළිදරව් කිරීමේ අපේක්ෂාවන් ක්‍රීඩා අමාත්‍යාංශය විසින් 2017 වර්ෂයේදී රු.මිලියන 197.47 ක් පිරිවැයකින් පිහිනුම් තටාකයක් ඉදිකර තිබුණි. මඩකලපුව මහනගර සභාවට භාරදී තිබුණු මෙම පිහිනුම් තටාකය ශූර ශූරියන්ට පිහිනුම් පුහුණුවීම සඳහා අවස්ථා සලසා නොදී, ආදායම් ඉපැයීමේ අරමුණෙන්, පෞද්ගලික පිහිනුම් පුහුණු කිරීමේ ආයතනයකට බදු දී | මෙය ඉදිකිරීමේ අරමුණු ලඟාකර ගැනීමේ ආකාරයෙන් පිහිනුම් තටාකය භාවිතා කළ යුතුය. | මෙම පිහිනුම් තටාකය මඩකලපුව මහනගර සභාවට භාරදී තිබූ අතර මෙය පිරිසිදුවටත්, සෞඛ්‍යාරක්ෂිතවත්, නඩත්තු කිරීමට මහනගර සභාව මාසිකව රු.76,220 ක් වැයවන බැවින්, මෙම වියදම හිලව් කිරීම සඳහා අර්ධ කාලීන කාර්යයන්වලින් ආදායම් ඉපැයීම සඳහා මෙම තටාකය ලබාදී ඇත. |

තිබුණි. මේ නිසා මෙම ව්‍යාපෘතිය මගින් අපේක්ෂා කළ ඉලක්කයන් ළඟා කර ගෙන නොතිබුණි.

### 3.2 බැරකම් හා බැඳීම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් ගොඩනැගිල්ල වෙනුවෙන් මඩකලපුව මහනගර සභාවට 2006 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා ගෙවිය යුතු රු.190,668 ක වරිපනම් බදු 2019 මැයි 15 දින වන විටත් නිරවුල් කර නොතිබුණි. | ගෙවිය යුතු වරිපනම් බදු නියමිත කාලයේදී ගෙවීමට කටයුතු කළ යුතුය. | කපාහැරීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත. |

### 3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|---|
| (අ) | සුනාමියෙන් පීඩාවට පත් අය නැවත පදිංචි කිරීම සඳහා ඉඩම් වන්දි ගෙවීමේ කටයුතු මන්මුනේ බටහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2017 වර්ෂයේදී සම්පූර්ණ කර තිබුණි. ඉන් පසුව පුද්ගලයන් තිදෙනෙකු විසින් ව්‍යාජ ලියකියවිලි ඉදිරිපත් කර රු.මිලියන 6.3 ක් වන්දි ලබාගෙන තිබුණි. එසේ වුවත්, අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වගකිව යුතු නිලධාරීන් විසින් සරල ලේඛනවල නිවැරදිභාවය පිළිබඳව අවධානය යොමු නොකර මෙම වන්දි මුදල් ගෙවීමට නිර්දේශ කර තිබුණි. එසේම එම නිලධාරී සිට | නිලධාරීන් නොසැලකිල්ලෙන් කටයුතු කළ බැවිනුත්, රාජකාරීය සිදුකළ බැවිනුත් රජයට පාඩු සිදුකළ බැවිනුත්, මුදල් රෙගුලාසි ප්‍රකාරව විනය ක්‍රියාමාර්ග ගත යුතුය. | ඉඩම් කටයුතු කළ නිලධාරීන්ට එරෙහිව සුදුසු පියවර ගැනීම සඳහා පියවර ගැනීම සඳහා ලේකම්වරයා, අභ්‍යන්තර, ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයට දන්වා ඇත. එසේම, එසේම අවිධිමත්ව වන්දි ලබාගත් පුද්ගලයන්ට එරෙහිව කටයුතු කළ යුතු බව මන්මුනේ බටහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට දැනුම් දී ඇත. |

| | | | |
|---|---|---|---|
| | විරුද්ධව කිසිදු ආකාරයක විනය පරීක්ෂණ ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | | |
| (ආ) | මඩකලපුව දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලයේ චෙක්පත් මගින් ගෙවීම් කිරීම, ලෙජර් ගිණුම් නඩත්තු කිරීම පිළිබඳව ප්‍රමාණවත් අභ්‍යන්තර පාලනයන් ඇති කිරීම සඳහා කළමනාකරණය අපොහොසත් වීම නිසා එම කාර්යාලයේ සේවය කළ සේවකයෙකු විසින් රු.5,700,000 ක් වටිනා චෙක්පත්වලට වංචනිකව මුදල් ලබාගැනීමට ඉඩ සලසා තිබුණි. | මුදල් රෙගුලාසි විධිවිධානවලට අනුව, චෙක්පත් භාවිතා කිරීමේ පද්ධති පිළිබඳ ඉතාමත් හොඳ අභ්‍යන්තර පාලන ක්‍රියාමාර්ග ඇති කිරීමට කටයුතු කළ යුතුය. | දෛනිකව චෙක්පත් අදාල නිලධාරීන් විසින් නිවැරදිතාවය පරීක්ෂා කර සහතික කිරීම් සිදුකර නොතිබුණි. එසේ වුවත්, දැනට සම්බන්ධිත නිලධාරියා විනය පරීක්ෂණ විමර්ශනයට ලක්කර වර්තමානයේ ස්ථාන මාරුකර යවා ඇත. අනාගතයේදී මෙවැනි දෝෂ සිදුනොවන ආකාරයට ක්‍රියාමාර්ග ගෙන ඇත. |
| (ඇ) | මුදල් රෙගුලාසි 177 ප්‍රකාරව රජයේ පාර්ශවයෙන් ලබාගන්නා මුදල් සියල්ල දෛනිකව හෝ හැකි ඉක්මනින් බැංකුවේ තැන්පත් කළ යුතුය. එසේ වුවත්, ඒරාවූර් නගර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය අවස්ථා 08 කදී රු.474,514 ක් දින 03 සිට 04 දක්වා කාල ප්‍රමාදයකින් පසුව තැන්පත් කර තිබුණි. | මුදල් රෙගුලාසි 177 ප්‍රකාරව කටයුතු කළ යුතුය. | මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදුකිරීම සඳහා විමර්ශනයක් ආරම්භ කර ඇත. එම විමර්ශනයේ වාර්තා ලැබූ වහාම ඒ පිළිබඳ කටයුතු කරනු ලැබේ. |

**4. මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පුරප්පාඩු පවතින පරිපාලන නිලධාරී තනතුරු 10 සඳහා ස්ථිර නිලධාරීන් බඳවා නොගැනීම නිසා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල කටයුතු දුර්වල තත්ත්වයක පවතී. | පුරප්පාඩු පවතින පරිපාලන නිලධාරී තනතුරු 10 සඳහා ස්ථිර නිලධාරීන් බඳවා නොගැනීම නිසා ගැනීම සඳහා කටයුතු කළ යුතුය. | පරිපාලන නිලධාරී තනතුරු පුරප්පාඩු නැවත පිරවීම පිළිබඳ ස්වදේශ කටයුතු අමාතයාංශයේ ලේකම්වරයාට දැනුම්දී ඇත. |